# 5 තුංමං හංදිය

සිංහල නවකතා වංශය තුළ මහගම සේකරගේ තුංමං හන්දිය සහ මනෝමන්දිර අපූර්ව නිර්මාණද්වයයක් හැටියට සැලකේ. නිර්දිෂ්ට ව ඇති තුංමං හන්දිය අධ්‍යයනයේදී සහ රසවින්දනයේ දී සැලකිය යුතු විශේෂ කාරණා කිහිපයක් ම ඇත්තේ ය.

තුංමං හංදිය, පසුගිය සියවසේ මුල් භාගයේ ශ්‍රී ලංකාවේ ගමක ජීවත් වූවන්ගේ තතු අව්‍යාජ විලාසයෙන් හෙළි කරන නවකතාවකි. එම කෘතිය වඩාත් ම වැදගත් වනුයේ, ලේඛකයාගේ ජීවිත අත්දැකීම් මැදි කොටගත් ආත්මකථන ස්වරූපයේ නවකතාවක් වන නිසා ය. මෙම කතාවේ කථකයා වන රණතුංග ආරච්චිගේ සිරිසේන, කතුවරයා වන මහගම සේකර ම බැව් හඳුනා ගැනීම අපහසු නැත.

සිරිසේනත්, ඔහුගේ දෙමාපියනුත්, ඔහුගේ මාමලා දෙදෙනා සහ පුංචිඅම්මාත් මෙම කෘතියෙහි ඉස්මතු ව දැක්වෙන ප්‍රධාන චරිත වේ. ඊට අමතර ව, කිසියම් ප්‍රමාණයකට නිරූපණය වන අවශේෂ චරිත ද රැසකි. එහෙත් වැදගත් ම කාරණය නම්, ඒ සියලුදෙනා ම අතරින්, කථකයාගේ ලොකු මාමා වන අබිලිං සිඤ්ඤෝගේ චරිතය වඩාත් ම ඉස්මතු කොට පෙනෙන්ට සැලැස්වීම ය. ඒ හේතු කොට ගෙන ම, මේ ප්‍රබන්ධය මගින් සිරිසේනගේ චරිතය පමණට ම අබිලිංගේ ද චරිතය ද විවරණය වන බව පාඨකයාට පැහැදිලි වනු ඇත

නවකතාව හඳුනා ගැනීමේ දී, චරිත පිළිබඳ එම කාරණය ගැන සැලකිලිමත් වීම මැනවි. අනෙක් විශේෂත්වය වනුයේ, මේ කතාව ගොඩනගන බස ය. කථන සිංහලය පමණට ම, ලේඛන සිංහලය ද කතුවරයා විසින් භාවිත කර ගෙන ඇත. කතාව ඉදිරියට ගලාගෙන යන්නේ සිරිසේන තමන්ගේ කතාව කියන ආකාරයෙන් වුව ද, කතුවරයා යොදාගන්නා විශේෂ උපක්‍රම නිසා, එය පිටස්තරයකුගේ දෑසට පෙනෙන විලාසයක් ද ගනී. එය මේ නවකතාවේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි.

අනෙක් විශේෂත්වය වනුයේ, කතුවරයා යොදාගන්නා අතිශය සජීවී අඛ්‍යාන රීතිය හෙවත් කතාව ගොඩනැඟීමේ පිළිවෙළ යි. එහි දී සජීවී ආකාරයෙන් කථන බස යොදාගන්නා අපූර් විලාසය දැක්ක හැකි ය. භාවිත සජීවී භාෂා විලාසය ද, සංවාද ද විමසා බැලීමෙන්, කතුවරයාගේ කතා කලාව මැනවින් හඳුනාගත හැකි ය.

තුංමං හන්දිය නවකතාව අවසන් වන්නේ, සිරිසේනගේ ලොකුමාමාගේ මරණයෙනි. එම අවස්ථාව වන විට, සිරිසේන කොළඹ මරදානේ කාර්මික විද්‍යාලයේ උගනිමින් සිටී. සිරිසේනගේ ජීවිතයේ ඊළඟ අවධිය විකාශනය කෙරෙන්නේ, මනෝමන්දිර නම් දෙවැනි කෘතියෙනි. සැබැවින් ම, එය තුංමං හන්දියේ දෙවැනි කොටස ය. සිරිසේනගේ තරුණ ජීවිතය නිර්ව්‍යාජ ආකාරයෙන් විවරණය කෙරෙන මනෝමන්දිර අවසන් වන්නේ, ඔහුගේ පොඩි මාමා වන සේතන් සිඤ්ඤෝ මුදලාලි උමතුබවට පැමිණීමත් ඉක්බිති ව ඔහු සියදිවි නසාගන්නා සිද්ධියකි.

එම නවකතාව ද කියවා බැලීම, තුංමං හන්දියේ නිරූපිත සිරිසේනගේ චරිතය වඩාත් හොඳින් අවබෝධ කරගැනීමට හේතු වනු නොඅනුමාන ය.

## ලිඛිත අභ්‍යාස

1. නව කතාවක මූලික අංග තුංමං හංදිය නව කතාව තුළ කොතෙක් දුරට දක්නට ලැබේදැයි නිදර්ශන ඇසුරෙන් විමසන්න.
2. තුංමං හංදිය නව කතාවේ ලොකු මාමාගේ චරිතය පිළිබඳ විවරණයක් කරන්න.
3. තුංමං හන්දිය නව කතාවේ භාෂා භාවිතය පිළිබඳව නිදසුන් සහිත ව අගයන්න.
4. තුංමං හංදිය නවකතාවේ සාර්ථකත්වයට එහි මනා සිද්ධි ගැළපීම ඉවහල් වී ඇත. විමසන්න.
5. තුංමං හන්දිය නවකතාවේ භාවිත දෘෂ්ටි කෝණය එහි සාර්ථකත්වයට ඉවහල් වී ඇති දැයි විමසන්න.